වේරා චැප්ලිනා

නරි පවුලේ කතාව

වේරා චැප්ලිනා

නව් හවුලේ කතාව

චිත්‍ර
වී. ගර්යාචෙවා

පරිවර්තනය
රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

Kanol

මේ කැලේ ඉන්න සත්තු...

ඉත්තෑවා



වල් ඌරා



හාවා



බැජ්රයා

වලහා

ඒ වගේ ම කැලේ වාසය කරන තවත් සතෙක් තමයි, නරියා.
දැන් අපි කියන්න යන්නේ නරියකු ගැන කතාවක්....

එකමත් එක කාලෙක මේ කැලයේ වාසය කළා නරි දෙනක්. ඉතාම නිස්කලංක තැනක ගහක් යට සුවපහසු තැනක් තෝරා ගෙන මේ නරි දෙන ගුහාවක් හාරන්න පටන් ගත්තා. ඒක ටිකක් අමාරු කටයුත්තක්. ගැඹුරු උමං හාරන්නටත්, නරි පැටවුන්ට සැපදායක බිලයක් හදන්නටත්, අනතුරුදායක වෙලාවක දී ප්‍රයෝජනයට ගන්න හදිසි දොරටු හරිගස්සන්ටත් සිදු වුණා. නරියා නරි දෙනට උදව් කළා. එකෙක් හාරන අතරතුර අනෙකා විවේක ගන්නවා.

දැන් ගුහාව සූදානම්. වැඩි දවසක් යන්න කලින් නරි පැටවුන්ගේ හීන් කෙඳිරිලි හඬ මේ ගුහාව ඇතුළෙන් ඇහෙන්න පටන් ගත්තා. මේ කුඩා නරි පැටවුන් කොහොමවත්ම උන්ගේ දෙමාපියන්ට සමාන වුණේ නෑ. නරි දෙන තඹ පාටයි. උගේ වලිගය දිගයි. ලොමින් පිරිලා. ඒත් නරි පැටවුන්ගේ ලොම් අළු පාටයි. වලිග කොටයි. නරි පැටවුන් ඉතාම පුංචියි, අහිංසකයි. උන්ට කිසි දෙයක් පේන්නෙත් නැහැ, ඇහෙන්නෙත් නැහැ. මේ පුංචි නරි පැටව් අම්මාගෙන් කිරි උරා බිව්වා. නරි අම්මා ගුහාවෙන් පිටතට ගියොත් නරි පැටවුන් එක ගොඩකට ගුලි වෙලා නිදා ගන්නවා.

මේ වගේ පුංචි නරි පැටව් ඉන්නකොට හරි කරදරේ. බඩ පිරෙන්න කන්න දෙන්න ඕනෑ, උණුසුම් කරන්න ඕනෑ, පිරිසිදු කරන්න ඕනෑ. නරි අම්මා බොහොම උනන්දුවෙන් නරි පැටවුන්ව ලෙවකෑවා. ඉතින් නරි පැටවුන්ගේ ලෝම හැමදාම පිරිසිදුව තිබුණා. නරි තාත්තටත් තිබුණේ පොඩි වැඩ තොගයක් නොවෙයි. දවස පුරාම හති හලමින්

කැලය පුරා දුව දුව ගොදුරු හොයනවා. එක්කෝ උගරු පැටියෙක් හරි වළි කුකුළු පැටියෙක් හරි අල්ලගෙන එනවා. එක්කෝ හබන් කුකුළකුව දඩයම් කරනවා. ඉතින් නරි අම්මගෙ බඩ පිරිලා. ඒ නිසා නරි පැටවුන්ව දාලා නරි අම්මට ඉවතට යන්න සිදු වුණේ නැහැ.

ටික කාලයක් යන විට නරි පැටවුන්ගේ ඇස් ඇරුණා. නරි පැටවුන් ඉපදිලා මාසයකට විතර පස්සේ උන්ට තනියෙම කකුල්වලින් හිට ගන්න පුළුවන් වුණා. නරි පැටවුන්ට ඉගැන්විය යුතු කාලය එළඹුණා. නරි අම්මා මී පැටියකුව අල්ලගෙන ඇවිත් උගව නරි පැටවුන් වෙතට අත හරිනවා. මී පැටියාව අල්ලාගන්න නරි පැටවුන් ඒ පසුපස

දුවන අතරතුර නරි අම්මා පැත්තකින් වාඩි වෙලා නරි පැටවුන්ගේ හඬට කන් දෙමින් උන් දිහා විමසිල්ලෙන් බලා ඉන්නවා. සැක සහිත සද්දයක් ඇහුණොත් නරි අම්මා හයියෙන් කෑ ගහනවා. එතකොට නරි පැටව් ටික එක පාරටම ගිහිල්ලා ගුහාවේ හැංගෙනගවා. කවුරු හරි කම්මැලි පැටියෙක් ප්‍රමාද වෙනවා නම් නරි අම්මා උගේ ලෝමවලින් අල්ලාගෙන ඇවිත් ගුහාව ඇතුළට තල්ලු කර දානවා. ඒ ආකාරයට පරිස්සමෙන් ඉන්න හැටිත්, අවටින් ඇසෙන ශබ්දවලට සවන් දෙන හැටිත් දෙමව්පියො දරුවන්ට ඉගැන්නුවා.

නරි පැටව් තුන් දෙනෙක් දෙමව්පියන්ට බොහොම කීකරුව හැදුණා. දෙමව්පියන් ගොදුරු හොයන්න ගියාම නරි පැටවුන් ගුහාව ඇතුළට වෙලා හිටියා මිසක එළියට ආවේ නැහැ. ඒත් හතරවෙනි පැටියා දෙමව්පියන් කියන දෙයක් ඇහුවේ නැහැ. එක දවසක් අම්මා දඩයමේ ගියාට පස්සේ ඌ ගුහාවෙන් එළියට ඇවිල්ලා පාට පාට ලොකු සමනලයෙක් පස්සේ එළවන්න පටන් ගත්තා. නරි පැටියා මේ විදියට කොයිතරම් සෙල්ලමට ලොල් වුණාද කීවොත් ඌට තේරුණේ නෑ තමන්ගේ නිවහනේ ඉඳලා ඌ කොයිතරම් ඈතට ගියා ද කියලා.

ඔහොම යනකොට නරි පැටියට මුණ ගැහුණා ඉත්තෑ පැටියකුව. නරි පැටියාට ඕනෑ වුණා ඌත් එක්ක සෙල්ලම් කරන්න. ඒත් ඉත්තෑ පැටවුන් එක්ක සෙල්ලමට යාම එතරම් හොඳ දෙයක් නෙවෙයි. බෝලයක් වගේ ගුලි ගැහුණු ඉත්තෑ පැටියා, ඉත්තෑ කූරු කෙළින් කර ගත්තා. නරි පැටියා ඌ ළඟට හිමින් හිමින් ළං වුණා. ඒත් ඉත්තෑ පැටියා උඩ පැන්නා විතරයි නරි පැටියාගේ නහයටම ඉත්තෑ කූරු ඇනුණා.

වේදනාවෙන් කෙඳිරි ගගා නරි පැටියා ආපසු ගෙදර යන්න හැරුණත්, ඌ ආපසු එන්න පාර දැනගෙන හිටියේ නැහැ.

ඔන්න ඔය විදියට නරි පැටියා අතරමං වුණා. උගේ නහයත් රිදෙනවා. ඒ මදිවට බඩගින්නකුත් දැනෙනවා. ඒ වෙලාවෙ ඌ එකපාරටම දැක්කා හාවෙක් තණගොල්ලේ ඉඳගෙන උඳුපියලිය කනවා. ඌ තමන්ගේ දිග කන් හරවමින් අවට සිදුවන දේවල්වලට කන් දෙනවා. නරි පැටියා හොරෙන් හොරෙන් හාවා ළඟට කිට්ටු වුණා.

නරි පැටියගේ සද්දය ඇහුණු ගමන් හාවා පිම්මක් දෙකක් පැනලා විදුලි වේගයෙන් කැලයට පැන ගියා. ගේ හොයා ගන්න නරි පැටියට හුඟක් වෙලා කැලය පුරා එහෙ මෙහෙ ඇවිදින්න වුණා. හොඳට ගියේ ආපසු එන ගමනේ දී නරි පැටියට වෘකයකුව හමු නොවුණු එක.

වෘකයින්ගේ දත් තියුණුයි, පාද ශක්තිමත්, වෘකයාට බොහොම වේගයෙන් දුවන්නත් පුළුවන්. ඌට අහුවුණා නම් නරි පැටියගෙ අවසානේ. මොකද නරියගේ ලොකුම හතුරා තමයි වෘකයා.

ඔහොම කාලය ගෙවිලා ගිහිල්ලා සරත් සමය එළඹුණා. නරි පැටව් හැදිලා වැඩිලා ගොඩක් ලොකු වුණා. උන් දැඩයම් කරන්නත් සතුරන්ගෙන් බේරී ඉන්නත් ඉගෙන ගත්තා. දැන් උන් දන්නවා තමන්ගේ හැම වැඩක්ම තනියෙම කරගන්න. ඉතින් කැලේ නොයෙක් පැතිවලට විසිරිලා ගිහින් උන් දැන් තනියෙම තමන්ගේ ජීවිත ගත කරනවා.



වේරා චැප්ලිනා

නම් හවුලේ කතාව

චිත්‍ර
වී. ගර්යාචෙවා

පරිවර්තනය
© රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-78-2

ප්‍රකාශනය

කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
යස ඉසුරු ප්‍රින්ටර්ස්

ප්‍රථම මුද්‍රණය 2018



















Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-78-2

kanolbooks.blogspot.com

Rs. 150/-